# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1889/35 - 2014 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා - 2014.11.21

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වැනි ව්‍යවස්ථාවේ (3අ) අනුව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලැබ, 2014 නොවැම්බර් මස 20 වැනි දින අංක 1889/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ ප්‍රකාශනය මගින්, වැඩිදුර කාලයක් සඳහා තමා තෝරාපත්කර ගැනීමෙන් ධුරය දැරීම පිණිස වරමක් ලබා ගැනීම සඳහා ජනතාව වෙත ආයාචනා කිරීමේ තම අභිලාෂය ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

ඒ අනුව්‍යවස්ථාව යටතේ ප්‍රකාශනයක් කරනු ලැබූ විට, ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයාට නියම කර ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 16 දරන ජනාධිපතිවරයා පත්කර ගැනීම පිළිබඳ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර -

(i) 2014 දෙසැම්බර් මස අට වැනි දිනය එම තෝරාපත් කිරීම සඳහා අපේක්ෂකයන්ගේ නාමයෝජනා කිරීමේ දිනය ලෙස ද,

(ii) මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය එම තෝරාපත් කිරීම සඳහා අපේක්ෂකයන්ගේ නාමයෝජනා කිරීමේ ස්ථානය ලෙස ද,

(iii) 2015 ජනවාරි මස අට වැනි දිනය එම තෝරාපත් කිරීම සඳහා ඡන්ද විමසීම පවත්වන දිනය ලෙස ද මේ නියමය මගින් නියම කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2014 නොවැම්බර් මස 21 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

12-257


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 20650— 100 (2014/11)